# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,032 - 2017 අගෝස්තු මස 11 වැනි සිකුරාදා - 2017.08.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1428 | පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | 1444 |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1439 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* -(i) විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත 2017 ජූලි මස 28 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත 2017 ජූලි මස 28 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 අගෝස්තු මස 31 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 අගෝස්තු මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවය

### පන්විල ප්‍රාදේශීය සභාව

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පන්විල ප්‍රාදේශීය සභාවේ දැනටමත් පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම්පත් "ලේකම්, පන්විල ප්‍රාදේශීය සභාව, පන්විල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ ඉහළ කොටසේ පන්විල ප්‍රාදේශීය සභාවේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු ය.

01. *තනතුර :*
සෞඛ්‍ය කම්කරු - III වැනි ශ්‍රේණියේ (ප්‍රාථමික ශිල්පීය නොවන)

02. *වැටුප් පරිමාණය :*
මෙම තනතුරට අයත් ඒකාබද්ධ වැටුප් ක්‍රමය මාසිකව, රු.24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410/- වනු ඇත. PL 1-2016 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි ආරම්භක පියවර) නමුත් වැටුප් ගෙවීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක II හි සඳහන් පරිදි ඔබට වැටුප් ගෙවීම් සිදු කරනු ඇත.
(මෙම වැටුප් ක්‍රමයේ හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

03. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

03.1 සියළුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.

03.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පූර්වාසන්න අඛන්ඩ වසර 03ක ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය. පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා ප්‍රමාණවත් සුදුස්සන් බල ප්‍රදේශය තුල නොමැති වූ විටෙකදී පමණක් යාබද පළාත් පාලන බල ප්‍රදේශයෙහි අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු ඇත.

03.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනටමත් සේවයේ නියුතු අය සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

03.4 දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඩුවම් නොලැබූ අයෙකු විය යුතුයි. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ අසාදු ලේඛණයට නම ඇතුලත් නොවිය යුතු ය.

04. *බඳවා ගැනීමේ සුදුසුකම් :*

04.1 *අධ්‍යාපන සුදුසුකම් :*
අධ්‍යන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සමත්ව තිබීම. මින් විෂයයන් පහක් එක් වරකදී සමත්ව තිබිය යුතු ය.

04.2 *කායික සුදුසුකම් :*
සෑම අපේක්ෂකයෙකුගේම මනා ඇස් පෙනීමකින් හා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු සෞඛ්‍යකින් යුක්ත විය යුතු ය.

05. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

05.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

05.2 වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.

05.3 පත්වීම් දින සිට අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් ය. පරිවාස කාලය අවසානයේ දී වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක තැනැත්තන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා සලකා බලනු ලැබේ.

05.4 01/2014 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සේවයට බැඳී වසර 5ක් ඇතුලත සේවයට බැඳුණු භාෂා මාධ්‍යට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීනතාවයක් ලබා ගත යුතුය.

05.5 මෙහි සඳහන් කර ඇති බඳවා ගැනීමේ කොන්දේසි සේවා ව්‍යවස්ථා හා ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසිවලට අමතරව රජය, පළාත් සභාව, පළාත් පාලන දෙපාර්තමේන්තුව හා සභාවේ ලේකම් වරයා විසින් නිකුත් කරන නියෝග ද, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝග වලට ද මෙම පත්වීම යටත් ය.

05.6 ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ බඳවා ගැනීම සඳහා වන අනෙකුත් පොදු කොන්දේසි අදාල වේ.

06. *කාර්යක්ෂමතා කඩඉම :*

බඳවා ගැනීමේ පන්තියට නියමිත වැටුප් පරිමාණයේ හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. මුල් පත්වීම් දිනයේ සිට වසර 03ක් ඇතුලත කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. තනතුරේ ස්ථිර කිරීම සඳහා කාර්යක්ෂමතා කඩඉම සමත්ව තිබීම අනිවාර්ය වේ.

07. *බඳවා ගැනීමේ ක්‍රමය :*

07.1 අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයකට යොමු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය ඉදිරියේදී දැනුම් දෙනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් ලිපිලේඛන හා ඒවායේ ඡායාස්ථ පිටපත් සූදානම්ව තබා ගත යුතු ය.

I. උප්පැන්න සහතිකයේ මුල් පිටපත,
II. අදාල අධ්‍යාපන සහතිකයේ මුල් පිටපත,
III. පාසැල හැර යාමේ සහතිකය,
IV. මෑතකදී ලබා ගත් ග්‍රාමනිලධාරී සහතිකය,
V. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්,
VI. වෘත්තීය නිපුණත්වය සනාථ කිරීමට අවශ්‍ය සහතික,
VII. සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකය.

07.2 තනතුර පුරප්පාඩු ගණන සඳහා සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයදුම්කරුවන් අතරින් වඩාත්ම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තෝරාගෙන බඳවා ගනු ලැබේ.

08. *අයදුම් කළ යුතු ආකාරය :*

08.1 එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

08.2 නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත පරිදි A4 ප්‍රමාණයේ කොලයක දෙපැත්තම භාවිත කර සකස් කරන ලද අයදුම්පතක් 2017.08.26 දින හෝ ඊට පෙර "ලේකම්, පන්විල ප්‍රාදේශීය සභාව, පන්විල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. (අයදුම්පත් පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.)

08.3 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ "සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා බඳවා ගැනීම" යන්න සඳහන් කළ යුතු ය.

08.4 අසම්පූර්ණව හෝ නියමිත දිනය පසුවී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.5 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සමාදාන විනිශ්චකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ වාර්ෂික වැටුප් රු.2,37,060/-ක් හෝ ඊට වැඩි රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරණ නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

08.6 බඳවාගනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පන්විල ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන කාලය අතරතුර කාල සීමාවේදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමේ හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ බලය හා මේ සම්බන්ධයෙන් වන ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ බලය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සතුය.

ලේකම්,
පන්විල ප්‍රාදේශීය සභාව,
පන්විල.

2017 ජූලි මස 25 වැනි දින,
පන්විල ප්‍රදේශීය සභාවේ දී ය.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා
අංකය

**මධ්‍යම පළාතේ පන්විල ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා අයදුම්පත**

01. 1.1 මුලකුරු සමග නම :——————————
1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————
02. 2.1 ස්ථිර ලිපිනය :——————————
2.2 දැනට රාජ්‍ය සේවයේ නිරත වූවෙකු නම් කාර්යාලීය ලිපිනය :——————————
03. 3.1 උපන් දිනය :——————————
3.2 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස: අවු. :———, මාස:———, දින :———.
04. ජාතික හැඳුනුම්පත් අංකය :——————————
05. දුරකථන අංකය :——————————
06. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————
07. අධ්‍යාපන සුදුසුකම් :——————————
7.1 අධ්‍යාපනය ලද පාසැල :——————————
7.2 *අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය :*

වසර :—————— විභාග අංකය :——————

| *විෂයය* | *සමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

7.3 *අ.පො.ස. (උසස් පෙළ) විභාගය :*
වසර :—————— විභාග අංකය :——————

| විෂයය | සමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

08. *වෘත්තීය සුදුසුකම් :* -ඃ

8.1 ………………………………………………………………………………
8.2 ………………………………………………………………………………
8.3 ………………………………………………………………………………

09. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම් භාර ගනු ලැබීමෙන් පසුව එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

————————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————

08-401

---

## අලව්ව ප්‍රාදේශීය සභාව

### ශිල්පීය නොවන III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ප්‍රමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහයක | 01 | රා.ප.ච.ලේ 3/2016 PL 1-2016 24250-10 x 250-10x270-10x300-12x330-36410 ( රා.ප.ච.ලේ 3/2016 අනුව වැටුප් ගෙවනු ලැබේ) | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙන් විෂයයන් 2 ක් සමත් විය යුතුය. |
| 02 | මුරකරු | 01 | | |
| 03 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 03 | | |
| 04 | සෞඛ්‍ය කම්කරු | 01 | | |

03. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

i. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ii. අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර (03) නොඅඩු කාලයක් අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛණයේ හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරන සහතිකයකින් සනාථ විය යුතුය)

iii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 නොවැඩි විය යුතුය. (දැනට ස්ථිර සේවයේ නියුතු අයට වයස් සීමාව බල නොපැවැත්වේ)

iv. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඩුවම් ලැබුවෙකු නොවිය යුතුය.

v. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය* :-

සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගි වන අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් සහ වාචික පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

05. *සේවයේ නියුක්තයකු වීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වසර 03 පරිවාස කාලයකට යටත් වේ.

(ii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව වයඹ ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසි වලට ද, මුදල් රෙගුලාසිවලට ද රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද, අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටිය යුතුය.

06. *අයදුම්පත ඉදිරිපත් කිරීම* :

(i) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත 2017.08.31 හෝ එදිනට පෙර "ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව, අලව්ව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(ii) අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ තනතුර සඳහන් කළ යුතුය.

(iii) අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

*(අ)* උප්පැන්න සහතිකය,

*(ආ)* අධ්‍යාපන සහතිකය,

*(ඇ)* අස්වීමේ සහතිකය.

*(ඈ)* පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය,

(ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය)

*(ඉ)* මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්,

*(ඊ)* වෘත්තිය පළපුරුද්ද පිළිබඳ සහතික.

මෙම අයදුම්පත් කැඳවීමකින් පසු හෝ කැඳවන අතරතුරේදී හෝ බඳවා ගැනීම හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම වෙනස් කිරීම හෝ නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

කේ. ආර්. පී. ජී. ආර්. කරුණානායක
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.

2017 අගෝස්තු මස 11 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.

**අලව්ව ප්‍රාදේශීය සභාවේ ශිල්පීය නොවන තනතුරු සඳහා බඳවා ගැනීම - 2017**

***................................ තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :____________________

02. මුලකුරුවලින් හැඳින්වෙන නම :____________________

03. ස්ථිර ලිපිනය :____________________

04. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :____________________

05. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————————
06. දිස්ත්‍රික්කය :——————————————
07. උපන් දිනය :
වර්ෂය :—————— මාසය :—————— දිනය :——————

08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ඃ
අවුරුදු :—————— මාස :—————— දින :——————

09. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් වන්නේ පරම්පරාවෙන්ද? ලියාපදංචියෙන් ද? යන වග :——————————————
11. විවාහක/අවිවාහක යන වග :——————————————
12. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————
13. අධ්‍යාපන සුදුසුකම් :——————————————
14. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :——————————————
15. සේවා පළපුරුද්ද :——————————————
*(අ)* දැනට සේවය කරන ආයතනය :——————————————
*(ආ)* දැනට දරන තනතුර :——————————————
*(ඇ)* එම තනතුරට පත් වූ දිනය :——————————————
*(ඈ)* මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන තනතුර :——————————————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන ........................................මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළහැක./නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————
(නිල මුද්‍රාව තැබිය යුතුය.)

08-361

## ගඟ ඉහළකෝරළේ ප්‍රාදේශීය සභාව

### මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත තනතුරු වලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංක* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමානය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| - | බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු | - 01 | - පී. එල්. 3 - 2016 - රු. 25,790 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු.38,990.00 | *(අ)* අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් සම්මාන 02ක් සහිතව විෂයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතු ය.<br>*(ආ)* මෝටර් රථ ප්‍රවහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල අදාල වන කාණ්ඩයේ මෝටර් රථ බල පත්‍රයක් ලබා තිබීම. බැකෝ ලෝඩරය හා මෝටර් ග්‍රේඩරය ක්‍රියා කරවීමට හැකිවිය යුතු ය.<br>*(ඇ)* තාර බර හොණ්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන බර ටේලර් සහ මගින් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබිම. (බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද "ඒ" වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රයට අනුව "බී" පන්තියේ බල පත්‍රයක් තිබීම) හා<br>*(ඈ)* ඉහත බලපත්‍රයට අතිරේකව තනතුරට අදාළ වන යන්ත්‍ර ක්‍රියාකරවීම සම්බනධව රජය පිළිගත් ආයතනයකින් (NITA/ ICTAD) පුහුණුව ලැබූ බවට (NVQ 4 මට්ටමට නොඅඩු) සනාථ සහතිකය, බැකෝ ලෝඩරය හා මෝටර් ග්‍රේඩරය ක්‍රියාකරවීමට හැකියාව ඇති පලපුරුද්ද ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සළකනු ලැබේ.<br>*(ඉ)* රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් රියදුරෙකු ලෙස වසර 03ක පලපුරුද්දක් ලබා තිබිය යුතු අතර සහතික මගින් සනාථ කළ යුතුය.<br>*(ඊ)* දිවා කාලයේදී හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීමට ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් තිබිය යුතු අතර මනා අස් පෙනීමක් තිබිය යුතුය..<br>*(උ)* අවම වශයෙන් උස අඩි 05 යි අඟල් 2 1/2 විය යුතු අතර මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු ය. |

03. *බඳවා ගැනීම සඳහා වු පොදු කොන්දේසි :*

1. අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතු ය.
2. අයදුම්කරුවන් ගඟ ඉහල කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අඛණ්ඩව වසර 03ක ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට වැඩි විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.
4. අයදුම්කරුවන් යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතු ය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවන් කරනු ලැබුවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවයෙන් පහ කරනු ලැබුවෙකු නොවිය යුතු ය.

03 *බඳවා ගැනීමේ ක්‍රමය :*

1. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම ප්‍රතිඵල අනුව බඳවා ගැනීම කරනු ලැබේ.
2. බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුරට බඳවා ගැනීමට පෙර ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයින්ගෙන් වෘත්තීය පරීක්ෂණයේ ප්‍රතිඵල මත අවශ්‍ය සියළු සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල මත බඳවා ගනු ලැබේ.
3. ලිඛිත පරීක්ෂණයේ මුළු ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. අවශ්‍ය සියළුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබීමෙන් පසු ඉහළ ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලැබේ.

04. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

*බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු*

01. බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුර කොන්ත්‍රාත් පදනම මත වසර 01ක සේවා කාලයක් සඳහා බඳවාගනු ලැබේ.
02. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.
03. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.
04. මීට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලටද ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලටද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පවරනු ලබන වෙනත් නියෝගවලටද, පළාත් පාලන කොමසාරිස් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ නියෝගවලටද, අනුකූලව කටයුතු කිරීමට සියළුම සේවකයින් බැඳී සිටී.
05. ප්‍රමාණවත් ඇපයක් මුදලින් හෝ නියම කරනු ලබන වෙනත් ආකාරයකින් ගෙවන ලෙසට නියම කළහොත් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කළ යුතු ය.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත් 2017.09.10 වැනි දිනට හෝ එදිනට පෙර "ලේකම්, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව, කුරුඳුවත්ත කඩ වීදිය" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් පස කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සකස් කළ යුතු වේ. අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසිවල ඉදිරිපත් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. *ඉදිරිපත් කල යුතු ලිපි ලේඛන :*

*අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායාපිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතු වේ.*

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික;
3. පදිංචිය පිළිබඳ ප්‍රදේශීය ලේකම්ගේ සහතිකය;
4. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිවරයාගෙන් විය යුතු ය);
5. ජාතික හැඳුනුම්පත;
6. පළපුරුද්ද පිළිබඳ සහතික;
7. වලංගු රියදුරු බලපත්‍රය;
8. බර වාහන ක්‍රියා කරවීම පිළිබඳ පළපුරුද්ද පිළිබඳ සහතික (රියදුරු තනතුරු සඳහා)

දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතු ය.

එච්. ටී. සරත් වික්‍රමසිංහ,
ලේකම්.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව,
කුරුඳුවත්ත කඩවීදිය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව***

*…………………………………………… තනතුර සඳහා අයදුම් පත්‍රය*

01 *(අ)* මුලකුරු සමඟ නම :____________________

*(ආ)* සම්පූර්ණ නම :____________________

02 ලිපිනය :____________________

03 ජාතික හැඳුනුම්පත් අංකය :____________________

04 උපන් දිනය :__________ අවුරුද්ද :______, මාසය :______, දිනය :______

2017.07.31 දිනට වයස :____________________

05 ස්ත්‍රී පුරුෂ භාවය :____________________

06 විවාහ/අවිවාහක භාවය :____________________

07 ජාතිය :____________________

08 ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද ? එසේනම් පරම්පරාවෙන් ද ? ලියාපදිංචි වීමෙන් ද? යන වග:____________________

09 අධ්‍යාපන සුදුසුකම් :____________________

10 වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :____________________

11 රියදුරු බලපත්‍රයේ

*(අ)* අංකය :____________________

*(ආ)* නිකුත් කළ දිනය :____________________

12 ඔබ දැනටමත් මෙම ආයතනයේ සේවය කරන්නේ නම් තනතුර හා සේවා කාලය:____________________
(එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/ අනියම්/ තාවකාලික/ ආදේශක/ දීමනා පදනම මතද යන වග)

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි.

මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත් තෝරා ගැනීමෙන් පසු දැන ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

දිනය :______

……………………
අයදුම්කරුගේ අත්සන.

08-458

---

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවය**

**මහර ප්‍රාදේශීය සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මහර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට බස්නාහිර පළාත තුළ පදිංචි සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය (මාසිකව)* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 02 | රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු.36,410 | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.) |
| 02 | සෞඛ්‍ය කම්කරු | 01 | රු.24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු.36,410 | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.) |

*බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

(1) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(2) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්නයේ වසර 03ක් අඛන්ඩව බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.
(3) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.
(රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩය බල නොපානු ඇත.)
(4) අයදුම්කරු තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
(5) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබුවකු හෝ රජයේ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.
(6) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස්කම් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම මහර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. (එහෙත් මේ පිළිබඳ රජයේ ප්‍රතිපත්ති තීරණයට ඔබ යටත් විය යුතුය.)
(ii) පත්වීමේ දින සිට අවුරුදු තුනක පරිවාස කාලයට යටත් වේ.
(iii) වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
(iv) මෙම බඳවා ගැනීමේදී කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ නියෝගවලටද බස්නාහිර පළාත් සභාව හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මහර ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

01. සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.
02. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂයේදී ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය.

1 උප්පැන්න සහතිකය;
2 අධ්‍යාපන සහතික;
3 පදිංචිය සනාථ කිරීමේ සහතිකය;
4 මෑතකදී ලබා ගත් ග්‍රාම සේවා සහතිකය;
5 මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්;
6 වෙනත් සුදුසුකම් දැක්වෙන සේවා සහතික;
7 පළපුරුද්ද පිළිබඳ සහතික.

*අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12x8 ප්‍රමාණයේ අයදුම්පත් සකස්කර ඉල්ලුම් කරන තනතුරට අදාළ කවරයේ වම්පස ලියා 2017.08.21 වැනි දිනට පෙර "ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි, මහර ප්‍රාදේශීය සභාව, පහල කරගහමුණ, කඩවත" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.) නියමිත දිනෙන් පසු ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එස්. ඒ. කේ. එන්. ඉන්ද්‍රජිත්,
ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
මහර ප්‍රාදේශීය සභාව.

2017 ක් වූ ජූලි මස 26 වැනි දින,
මහර ප්‍රාදේශීය සභාව,
පහල කරගහමුණ - කඩවත.

මහර ප්‍රාදේශීය සභාව

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ................................................. තනතුර සඳහා බඳවා ගැනීම*

01 මුලකුරු සමඟ නම :—————————————

මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————————————

02 ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————————————

03 ස්ථිර ලිපිනය :—————————————

04 ස්ත්‍රී /පුරුෂ භාවය :—————————————

05 උපන් දිනය :—————————————

2017.08.21 දිනට වයස : අවුරුදු :————— මාස :————— දින :—————

06 ජාතික හැඳුනුම්පත් අංකය :—————————————

07 ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද/ ලියාපදිංචි වීමෙන් ද? :—————————————

08 දුරකථන අංකය :—————————————

09 (i) අධ්‍යාපන සුදුසුකම් :—————————————

(ii) අ.පො.ස. (සා.පෙළ) :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(iii) අ.පො.ස. (උසස් පෙළ) :

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

10 වෙනත් සුදුසකම් :—————————————

11 සේවා පලපුරුද්ද : (i) දැනට දරන තනතුර :—————————————

(ii) එම තනතුරට පත්වූ දිනය :—————————————

(iii) එම තනතුරෙහි සේවා කාලය :—————————————

(iv) මීට පෙර සේවය කරන ලද ස්ථාන හා දරන ලද තනතුරු :—————————————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.
මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බව මා තෝරා ගැනීමට පෙර හෝ පසුව හෙළි වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

දිනය .....................

........................
අයදුම්කරුගේ අත්සන

*දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ අත්සන*

මෙම ඉල්ලුම්කරු වන ......................................... මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම කාර්යාලයේ ......................................... වශයෙන් සේවය කරයි. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/ නොකරමි.

........................
දිනය ..................... ආයතන ප්‍රධානියාගේ අත්සන

08-478

සංශෝධනයයි

**මොරටුව මහා නගර සභාව**

මොරටුව මහා නගර සභාවේ පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා අයදුම්පත් කැඳවමින් 2017.07.28 දින පළාත් පාලන ගැසට් පත්‍රයේ පළකරන ලද රියදුරු තනතුරට අදළ බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම පහත පරිදි සංශෝධනය විය යුතු බව දන්වමි.

"අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම. (එක් වරක දී විෂයයන් (05) අවම වශයෙන් සමත් ව තිබිය යුතුය.)"

තවද එම තනතුරේ අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2017.08.31 දින ලෙස සංශෝධනය කරන ලද බව දන්වමි.

එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම,
නාගරික කොමසාරිස්,
මොරටුව මහා නගර සභාව.

08-664

---

# පළාත් පාලන නිවේදන

**හලාවත ප්‍රාදේශීය සභාව**

ග්‍රාමීය මාර්ග නම් කිරීම සම්බන්ධ කරනු ලබන දැන්වීම

හලාවත ප්‍රාදේශීය සභාවේ 2016.09.14 දින මෙහෙයුම් කමිටුවේ අනුමත වී ඇති පහත සඳහන් මාර්ගය යෝජිත නමින් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධව විරෝධතා ඉදිරිපත් වී නොමැති අතර 1975 අංක 04 දරන වීථි නම් කිරීම හා ස්මාරක පිහිටුවීම හා පාලනය කිරීමේ පනතේ 6 වන වගන්තිය හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය 9-03 වගන්තිය සමග කියවෙන 198 වගන්ති ප්‍රකාරව 2016.12.02 දිනැති ලිපිය මගින් ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇති පහත උපලේඛනයේ සඳහන් මාර්ගය සඳහා යෝජිත ''කන්නන්ගර මාවත'' නම භාවිත කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත්කරමි.

01. මුගුණුවටවන ග්‍රාම නිලධාරි වසමේ මීතුරු උයන ප්‍රදේශයේ නිවාස සඳහා ගමන් කිරීමට ඇති මාර්ගය - ''කන්නන්ගර මාවත''

| *අනු. අංකය* | *නම් කරන ලද මාර්ගය* | *යෝජිත නාමය* |
|---|---|---|
| 01 | මුගුණුවටවන ග්‍රාම නිලධාරි වසමේ මීතුරු උයන ප්‍රදේශයේ නිවාස සඳහා ගමන් කිරීමට ඇති මාර්ගය | ''කන්නන්ගර මාවත'' |

ආර්. ජේ. ඒ. එස්. හේමලතා,
ලේකම්,
හලාවත ප්‍රාදේශීය සභව.

08-426

## යටිනුවර ප්‍රාදේශීය සභාව

1893 අංක දරන ගෝඝාතක ආඥාපනත හා ඊට සංශෝධන පනත් යටතේ එහි අංක 7 (I) හි පරිදි ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා (ජා.හැ. අංක 922592241V) එම්. එස්. ඒ. අස්මි මහතා විසින් මෙහි සඳහන් වගුවේ විස්තර වන ස්ථානයට බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කර ඇත.

02. එකී ස්ථානයට එබඳු බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධව කරුණු ඉදිරිපත් කරනු කැමති වූ යටිනුවර ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත පදිංචි තැනැත්තන් විසින් එසේ විරුද්ධත්වයට තිබෙන කරුණු පිළිබඳ ලිඛිත ප්‍රකාශයක් පිටපත් දෙකකින් (2) යුක්තව මෙම නිවේදනය ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ දින සිට දින 60 ක් ඇතුළත පහත සඳහන් නිසි බලධාරියා වන එහි සඳහන් 3 ආ වගන්තිය හා 1987 අංක 15 දරන එම පනතේ 9 වැනි වගන්තිය හා 3 වැනි වගන්තියේ විධිවිධානවලට අනුව නිසි බලධරයා වූ ලේකම් යටිනුවර ප්‍රාදේශීය සභාව ඇඹිල්මීගම පිළිමතලාව වෙත එවිය යුතුය. තැපෑලෙන් එවන විට ලියුම් කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ විරෝධකරු ලෙස සඳහන් කළ යුතු අතර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ගෝඝාතකාගාරය පවත්වාගෙන යාමට ඉල්ලුම් කරන ස්ථානයේ විස්තර ඇතුළත් වගුව.

| *ගෝඝාතකාගාරය පවත්වාගෙන යාම සඳහා ඉල්ලුම් කළ තැනැත්තාගේ නම හා ලිපිනය* | *ස්ථානය අයිතිකරුගේ නම හා ලිපිනය* | *ගෝඝාතකාගාරය පවත්වාගෙන යාම සඳහා අදහස් කරන ස්ථානයේ ලිපිනය හා හඳුනා ගැනීමේ විස්තරය* | *ග්‍රාම නිලධාරී වසම* |
|---|---|---|---|
| එම්. එස්. ඒ. අස්මි මයා<br>අංක 45/සී,<br>දෙහිඅංග, මුරුතලාව | ඒ. එම්. එම්. මුහාජරින මයා,<br>අංක 170,<br>දෙහිඅංග, මුරුතලාව | දෙහිඅංග, ගලහා කුඹුර පාර<br>නිකගොල්ල හේන වත්ත | දෙහිඅංග<br>උතුර |

ඩබ්ලිව්. ඒ. එල්. තුෂාරී ජයරත්න,
ලේකම්,
යටිනුවර ප්‍රාදේශීය සභාව

තීරණ අංක : 733
දිනය : 2017-07-18

08-362

---

## කුරුණෑගල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විශේෂ විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමග කිය විය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය ප්‍රකාරව වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව කුරුණෑගල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ විස්තර සහිතව දක්වා ඇති මං මාවත් පහත සඳහන් පරිදි අලුතින් නම් කර ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

ඩී. ඩී. වික්‍රමසිංහ,
ලේකම්,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2017 ජූලි මස 12 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව,
මල්පිටිය - බෝයගනේ.

| පළාත් පාලන ආයතනයේ නම | දිස්ත්‍රික්කය | වර්තමාන නම | අලුතින් යොදා ඇති නම | වෙනත් |
|---|---|---|---|---|
| කුරුණෑගල ප්‍රාදේශීය සභාව | කුරුණෑගල | විල්ගොඩවත්ත ප්‍රධාන මාර්ගය | අනගාරික ධර්මපාල මාවත | ආරම්භය :- විල්ගොඩ හන්දිය<br>අවසානය :- අමුණ දක්වා |
| | | විල්ගොඩවත්ත පිට්ටනිය අසල දකුණ | පැරකුම් මාවත | ආරම්භය :- ජේ.පී.ලිලී පෙරේරාගේ නිවස<br>අවසානය :- ජී.කේ. අශෝකාගේ නිවස |
| | | විල්ගොඩවත්ත පිට්ටනිය අසල වම | සූරතිස්ස මාවත | ආරම්භය :- නිමල් සපුතන්ත්‍රීගේ නිවස<br>අවසානය :- රනිල් සංජය සිල්වාගේ නිවස |
| | | විල්ගොඩවත්ත ඇල ඉවුර දකුණ | අභය මාවත | ආරම්භය :- ජනක ද සිල්වාගේ නිවස<br>අවසානය :- කේ.ඩී. ඇලන් නෝනාගේ නිවස |
| | | විල්ගොඩවත්ත ඇල ඉවුර වම | වසභ මාවත | ආරම්භය :- පී.ඩී.එච්. ඩබ්. විජිතපාලගේ නිවස<br>අවසානය :- ඩී.පී. උපාලිගේ නිවස |
| | | 6 පටුමග | විජයබා මාවත | ආරම්භය :- ඩබ්.පී. වෙත්තසිංහගේ නිවස<br>අවසානය :-රූපිකාගේ නිවස |
| | | 7 පටුමග | කාශ්‍යප මාවත | ආරම්භය :- එන්.ජී. ගුණරත්නගේ නිවස<br>අවසානය :- ජී. රමනි පුෂ්පලතාගේ නිවස |
| | | පන්සල පාර | රණවිරු මාවත | ආරම්භය :- ඩී.වී.බී. ලක්ෂ්මන්ගේ නිවස<br>අවසානය :- ආර්.ඩී. සිරිසේනගේ නිවස |
| | | 9 පටුමග | ගැමුණු මාවත | ආරම්භය :- ඩබ්. එච්. හේමලතාගේ නිවස<br>අවසානය :- අනුර රංජන් නිවස |
| | | 10 පටුමග | වලගම්බා මාවත | ආරම්භය :- ඩබ්.එච්. ධර්මවතීගේ නිවස<br>අවසානය :- ජී. එම්. ප්‍රේමාවතී නිවස |

| පළාත් පාලන ආයතනයේ නම | දිස්ත්‍රික්කය | වර්තමාන නම | අලුතින් යොදා ඇති නම | වෙනත් |
|---|---|---|---|---|
| | | 11 පටුමග | ධාතුසේන මාවත | ආරම්භය :- කුලකාන්තාගේ නිවස අවසානය :- ඒ.එම්.සුගත් සේනාරත්නගේ නිවස |
| | | 12 පටුමග | රණවිරු මාවත 2 | ආරම්භය :- ඒ. ගුණදාසගේ නිවස අවසානය :- එච්. වයි. උපාලිගේ නිවස |
| | | 13 පටුමග | ධර්මපාල මාවත | ආරම්භය :- ඒ.පී. නිහාල්ගේ නිවස අවසානය :- එම්.එම්. කරුණාරත්නගේ නිවස |
| | | 14 පටුමග | මුගලන් මාවත | ආරම්භය :- ඩී.පී.ප්‍රදීප් නිලන්තගේ නිවස අවසානය :- එච්. එම්. ශ්‍රියානි හේරත්ගේ නිවස |
| | | 15 පටුමග | මිහිඳු මාවත 1 | ආරම්භය :- අබේගුණවර්ධනගේ නිවස අවසානය :- ප්‍රියන්ත බස්නායකගේ නිවස |
| | | බෙන්තරවත්ත මාවත | මිහිඳු මාවත 11 | ආරම්භය :-එච්. පී. ජගත් තෙන්නකෝන්ගේ නිවස අවසානය :- සරත් සිල්වාගේ නිවස |
| | | බුදුමෙවත්ත මාවත | මිහිඳු මාවත 111 | ආරම්භය :- ඒ. එච්. තිලකරත්න අවසානය :- ෆොන්සේකාගේ නිවස |
| | | 18 පටුමග | ගජබා මාවත | ආරම්භය :- සුරංගගේ නිවස අවසානය :- නිහාල් ගාල්ලගේ නිවස |

| පළාත් පාලන ආයතනයේ නම | දිස්ත්‍රික්කය | වර්තමාන නම | අලුතින් යොදා ඇති නම | වෙනත් |
|---|---|---|---|---|
| | | 19 පටුමග | රාජසිංහ මාවත 1 | ආරම්භය :- එච්.එම්.ආර්. අමිලගේ නිවස අවසානය :- එච්.වයි.තිලක්ගේ නිවස |
| | | බුදමෙවත්ත මාවත 2 | රාජසිංහ මාවත 11 | ආරම්භය :- පී. ෆොන්සේකාගේ නිවස අවසානය :- ඒ. එච්. තිලකරත්නගේ නිවස |
| | | 21 පටුමග | වීදියබණ්ඩාර මාවත | ආරම්භය :- ඩබ්.කේ. ශාන්තිලතාගේ නිවස අවසානය :- සුදේශ් මහේන්ද්‍රගේ නිවස |
| | | කොලපැලලිකන්ද පාර | දන්ගහ කුඹුර මාවත | ආරම්භය :- මයිලෑවගේ නිවස අවසානය :- එස්.ඩී. ෆාරුක්ගේ නිවස |

08-242

---

## මොරටුව මහ නගර සභාව

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් එම උපලේඛනයෙහි සඳහන් ස්ථානයේ මස් වෙළඳාම පවත්වාගෙන යාම පිණිස 2017 වර්ෂයට විශේෂ බලපත්‍ර ඉල්ලුම් කර ඇත. ඒ අනුව විශේෂ බලපත්‍ර නිකුත් කිරීම සඳහා මොරටුව මහ නගර සභා සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවීමට බල ඇති බවත් (272 වැනි අධිකාරිය) ගෝඝාතක ආඥපනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

නාගරික කොමසාරිස්,
මොරටුව මහ නගර සභාව.

2017 ජුනි මස 12 වැනි දින,
මොරටුව මහ නගර සභාවේ දී ය.

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථානය* | *වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය* | *වෙළඳ ව්‍යාපාරයේ නම* |
|---|---|---|---|
| යූ. ඩී. ප්‍රදීප් කුමාර අංක 8/2, දුම්රියපොළ පාර, මොරටුව. | අංක 8/2, දුම්රියපොළ පාර, මොරටුව | ශීතකළ කුකුල්මස් විකිණීම | සංජීව ස්ටෝර්ස් |

08-470

# ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව

මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත්කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ඒ.එෆ්.පී. ප්‍රනාන්දු වන මම ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත්කිරීමට 2017.06.14 දිනැති අංක 82 (06) දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ.එෆ්.පී. ප්‍රනාන්දු,
ලේකම් හා බලතල කාර්ය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව.

2017 ජූනි මස 14 වැනි දින,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව සහ 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 216 විධිවිධානවලට අනුකූල වන පරිදි පහත උපලේඛනවල සඳහන් සකස් කරන ලද ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම, 2016.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මහජනතාවගේ දැනගැනීම සඳහා ප්‍රකාශයට පත්කිරීමට මා තීරණය කරමි.

*උපලේඛන 1*

2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම.

*2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම*

| 1. පුනරාවර්තන ආදායම් | *2015* | *2016* |
|---|---|---|
| 10 වරිපනම් හා බදු | 2,941,254.19 | 3,586,543.59 |
| 20 කුලී | 2,502,875.00 | 7,322,197.77 |
| 30 බලපත්‍ර ගාස්තු | 2,116,097.86 | 1,598,275.52 |
| 40 සේවා සඳහා ගාස්තු | 1,026,672.16 | 1,012,154.67 |
| 50 දඩ හා වරෙන්තු ගාස්තු | 5,005,206.00 | 9,234,511.10 |
| 60 වෙනත් ආදායම් | 7,617,841.72 | 8,345,403.69 |
| 70 ආදායම් ආධාර | 26,676,411.40 | 28,945,066.47 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **47,886,358.33** | **60,044,152.81** |
| **2. පුනරාවර්තන වියදම්** | | |
| 01 වැටුප් හා දීමනා | 33,182,895.00 | 33,531,334.99 |
| 02 ගමන් වියදම් | 255,438.00 | 246,504.42 |
| 03 සැපයුම් හා උපකරණ | 3,411,006.48 | 3,807,973.32 |
| 04 ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව | 6,525,161.31 | 11,992,234.17 |
| 05 ප්‍රවාහන, සම්බන්ධතා හා සේවා | 2,446,416.54 | 4,229,052.89 |
| 06 පොලී ගෙවීම් හා ලාභාංශ | | |
| 07 ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 136,270.74 | 94,355.01 |
| 08 විශ්‍රාම වැටුප් හා විශ්‍රාම පාරිතෝෂික | 74,092.47 | 102,466.71 |
| **පුනරාවර්තන වියදම් එකතුව** | **46,031,280.54** | **54,003,921.51** |

| | *2015* | *2016* |
|---|---|---|
| පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ/ අඩු වූ ආදායම හා වියදම | 1,855,077.79 | 6,040,231.30 |
| 3. ප්‍රාග්ධන වියදම් | | |
| 80 මූලධන ආධාර | 73,023,133.30 | 11,973,523.12 |
| **පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම හා ප්‍රාග්ධන ආදායම** | **74,878,211.09** | **18,013,754.42** |
| 4. ප්‍රාග්ධන වියදම් | | |
| 09 උපකරණ වැය | 73,805,319.42 | 11,580,141.44 |
| **අතිරික්තය හෝ ඌනතාවය** | **1,072,891.67** | **6,433,612.98** |

## උපලේඛන II

2016.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

*2016.12.31 වැනි දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය*

| | *සටහන්* | *2015.12.31* | *2016.12.31* |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | - | | |
| දේපළ පිරියත හා උපකරණ | 06 | 64,747,729.33 | 134,703,136.85 |
| **ජංගම වත්කම්** | - | | |
| තොගය | 07 | 847,002.44 | 2,357,523.12 |
| ආදායම් ණයගැතියෝ | 08 | 40,542,083.84 | 58,781,767.03 |
| සේවක ණය හා අත්තිකාරම් | 09 | 4,888,771.95 | 6,004,500.30 |
| පෙර ගෙවුම් | 10 | | |
| ආයෝජන | 11 | 100,289.13 | 6,626,022.46 |
| මුදල් හා මුදල් සමාන දේවල් | 12 | 1,716,641.60 | 1,925,656.53 |
| | | 48,094,788.96 | 75,695,469.44 |
| **මුළු වත්කම්** | | **112,842,518.29** | **210,398,606.29** |
| **හිමිකම් හා වගකීම්** | | | |
| සමුච්චිත අරමුදල හා සංචිත | 13 | 101,529,529.56 | 196,927,670.74 |
| | | 101,529,529.56 | 196,927,670.74 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| දිගු කාලීන ණය | 14 | | |
| ජංගම වගකීම් | 15 | 11,312,988.73 | 13,470,935.55 |
| | | 11,312,988.73 | 13,470,935.55 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **112,842,518.29** | **210,398,606.29** |

**උපලේඛන III**

2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

*2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය*

| | *2015.12.31* | *2016.12.31* |
|---|---|---|
| ***මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය*** | | |
| සාමාන්‍ය මෙහෙයුම්වලින් ලද අතිරික්තය/(ඌනතාවය) | 4,873,960.13 | 6,040,231.30 |
| **මුදල් නොවන අයිතමයන්ගේ වෙනස්වීම් සඳහා ගැලපීම** | – | |
| ක්ෂය වීම් | | |
| පෙර වර්ෂය සඳහා ගැලපීම | 1,787,496.58 | 4,325,217.21 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය/ ඌනතාවය** | **6,661,456.71** | **10,365,448.51** |
| ***කාරක ප්‍රාග්ධනයේ සංචලයන්*** | | |
| තොග/ණය ගැතියන් වෙනත් ලැබීම් (වැඩිවීම)/අඩුවීම | - 1,560,751.97 | (19,004,080.72) |
| ණය හිමි හා වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම/ (අඩුවීම) | - 3,424,154.20 | 6,855,483.02 |
| **මෙහෙයුම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | **1,676,550.54** | **(12,148,597.70)** |
| පාරිතෝෂික ගෙවීම් | - | |
| **මෙහෙයුම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **1,676,550.54** | **(1,783,149.19)** |
| ***ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය*** | | |
| දේපළ මිලට ගැනීම් | (15,651,041.00) | (1,887,280.84) |
| ප්‍රාග්ධන වියදම් | (559,842.41) | (9,692,860.60) |
| මුදල් ආයෝජන | (4,799.10) | (5,431.39) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(16,215,682.51)** | **(11,585,572.83)** |
| ***මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය*** | | |
| ප්‍රාග්ධන ලැබීම් | 15,189,115.00 | 11.973,523.12 |
| ණය ගැනීම්/(ගෙවීම්) | | |
| ***මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය*** | **15,189,115.00** | **11.973,523.12** |
| **වර්ෂය තුළ ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **649,983.03** | **(1,395,198.90)** |
| 2016.01.01 වැනි දිනට මුදල් හා මුදල් සමාන දෑ | 1,066,658.57 | 3,320,855.43 |
| **2016.12.31 වැනි දිනට මුදල් හා මුදල් සමාන දෑ (සටහන 01)** | **1,716,641.60** | **1,925,656.53** |
| සටහන 01 : | | |
| මහජන බැංකු ජංගම ගිණුම - පොදු | 1,524,459.77 | 1,793,511.02 |
| මහජන බැංකු ජංගම ගිණුම - සේවක ණය | 190,686.83 | 132,145.51 |
| සුළු මුදල් | 1,495.00 | |
| | **1,716,641.60** | **1,925,656.53** |

08-446